## ගැබ්බර කෙත් යාය


රන් පැහැ පලසක් අතුරවා
වෙත්පත් සියොත් කැල
තුටු සිලිලෙ ගිල්වා
ගත රැදි සළු සේල
මඳ නලින් විහිදා
රහයි නෙත්කළු රැගුම්
කල්බඳක් විලසා
ගැබ් බරවූ කෙත්යාය
තුටින් මදහසිනා

♦ **දුලිනි මදාරා වෙඩික්කාර**
**ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය**
**පානදුර Sri Lanka**

## දරු පෙමැති මවුනි !

මා හැර දමා දුරු රට ගිය
අපෙ අම්මේ
නෑ ඔබ ම'සුව පතමින්
ලියුමක් දැම්මේ
ඒ ඔබෙ දාස කාරිය
නැතිවද නිම්මේ
දූ මම බලමි මග
ඔබ එනතුරු අම්මේ
ඔබ ගිය ගමන් වැසි
ගෙය තෙමුවා අම්මේ
ඔබ ගිය නමුදු අපෙ
ණය නිම නැහැ අම්මේ
ඔබ ගිය නමුදු අප
පැල්පත තුළ අම්මේ
ඔබ ගිය නිසා ඉඩමද
සින්නයි අම්මේ
දුරු රට නොහඳුනන
නිවසක දාසි ඔබයි
හුරු රට මෙ අප නිවසෙම
දාසිය ද මෙමයි
කරු ගස ගසා රැකගමු
දිවි සතුට නිමයි
ආදර මව්නි අපෙ
සතුටද ඔබම තමයි

♦ **කේ. ආර්. මෙත්මා රණසිංහ**
**බිබිලාදෙණිය ශ්‍රී ගුණානන්ද ම. වි.**
**කුලියාපිටිය Sri Lanka**




**Children's Corner**

## Ballooning බැලූමක නැගී යෑම



People flew first not in aeroplanes but in balloons filled with gas lighter than air. On 21 November 1783 in Paris, two men were lifted into the air by a huge paper balloon filled with hot air made by the French Montgolfer brothers. A fortnight later, two others had flown over Paris in a rubberized silk balloon filled with hydrogen gas. In the 1800s, flying in hydrogen balloons was a fashionable sport. When the idea of ballooning revived in the 1960s, however, people used a cheaper, safer hot-air system.

මිනිසා මුලින්ම පියාසර කළේ අහස්යාත්‍රාවේ නොව සැහැල්ලු වායුවක් පුරවන ලද බැලූමකය. 1783 නොවැම්බර් 21 වෙනි දින පැරිසියේ දී ප්‍රංශ මිනිසුන් දෙදෙනෙක් උණු වාතය පුරවන ලද බැලූමක නැගී අහස්ගත වූහ. සති දෙකකට පසු තවත් දෙදෙනෙක් රබර් මිශ්‍රිත සිල්ක් බැලූමක හයිඩ්‍රජන් වායුව පුරවා එහි නැගී ගුවනට ගියෝය. 1800 වසර වන විට බැලූමේ යෑම මෝස්තරකාරී ක්‍රීඩාවක් වුණි. 1960 ගණන් වල බැලූමේ පියාසර කිරීම නැවත මතුව ආ විට මිනිස්සු ලාභදායී, වඩාත් සුරක්ෂිත, උනුසුම් වාතය පිරවිය හැකි ක්‍රමය භාවිතා කරන්නට පුරුදු වූහ.

♦ ***Auntie Ramani*** (***රමණී නැන්දා***)

සහසක් සිහින මාළිගා තනා
සහසක් පැතුම් පොදි බැඳ
වැලිකතරට ගිය ඔබ
සහස් දුක් උහුලමින්
අපේ ලොව ගොඩනගයි....
ඔබෙ දිරිය ඔබෙ සවිය
නිබඳ රැකවලක් වී
අපෙ පුංචි ලෝකයට
සිනා මල් වස්සයි....

## වැලිකතරට ගිය අක්කණ්ඩියේ

♦ ***කාංචනා කුමාරි***
**10 වසර බී**
***මහානාම ම. වි.***
***තිරප්පනේ***
**Sri Lanka**


## නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

**BANK OF CEYLON (UK) Ltd.**

ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
**දැන් විවෘතයි...!**

- ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- පුද්ගලික ව්‍යාපාරික ණය
- ආනයන හා අපනයන සේවාවන්
- විදේශ මුදල් (යූරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

අප මගින් ශ්‍රී ලංකාවට මුදල් යවන ඔබ සැමට ලංකාවට ගොස් නැවත පැමිණීමට ගුවන් ටිකට් පතක් දිනාගැනීමේ අවස්ථාවක්...!
2012 ජූලි තෙක් සෑම මසකටම වරක්...!
මුදල් යවන වාර ගනන වැඩිවන තරමට දිනන අවස්ථාද වැඩිවේ..!



BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka


1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD




## සුභාවිත ගීතයේ මෛත්‍රී සළකුණ

# සුදු වැලි




මෛත්‍රී පනාගොඩ කලාකරුවාණන් විසින් අප වෙත එවන ලද **සුදු වැලි** නම් සංයුක්ත ගී තැටිය තැපැලෙන් නොබෝදා ලැබිණ. එයට සාවධානව ඇහුම්කන් දී එම ගී රසවිඳීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් ලිවිය යුතු යයි සිතුණි. එසේම මා කලක් සිට මෛත්‍රී හඳුනන බැවින්ද, මා මෙන්ම ලන්ඩනයේ වෙසෙන අප ජන සමාජයේ බොහෝ දෙනෙකු ඔහුගේ සහෘද සමාගමය ප්‍රියකරන නිසා ඔවුන්ගේ දැනගැන්ම ද උදෙසාත් ය.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර වෙසෙමින් ප්‍රකට නීතිඥවරයෙකු ලෙස අද එහි කාර්‍යබහුල එමෙන්ම සාර්ථක වෘත්තියක යෙදී සිටින්නේ නමුදු ඒ නිසා මෛත්‍රී පනාගොඩ සතු සාහිත්‍ය කුසලතාවන්ට කිසිදු බාධාවක් වී ඇති බවක් නොපෙනේ. ඔහුගේ ලේඛන කලාව සහ පත්‍රකලාව ඔවුන් විසින් සංස්කරණය කර ලොවපුරා වෙබ් මාධ්‍යයෙන් බෙදා හරින විද්‍යුත් පුවත් සඟරාවෙන් අපට නිතර දක්නට ලැබෙයි. ඒ හරවත් ලියුම් කියුම් වලට අමතරව ඔහුගේ කවි පබැඳුම් පුවත්පත් වල නිතර පළවෙයි. මෙම **ලංකාවිත්ති** පත්‍රයෙහි ද බොහෝ වාරයක් පළකර ඇත.

නිසග කවිත්වය මෛත්‍රී තුළ නොඅඩුව පවතී. එය ඔප මට්ටම් වූයේ ඔහු කොළඹ ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයෙකුව අධ්‍යාපනය පටන්ගත් මුල් අවධියේ සිටය. සැබැවින්ම ආනන්ද ය යනු ලොවට විවිධ අංශයන්ගෙන් කුසලතා පූර්ණ පුද්ගලයන් බිහිකළ විශිෂ්ඨ ආයතනයකි. එහි දී මෛත්‍රීගේ වූ දීප්තිමත් ශිෂ්‍යභාවයට එවකට ලකිසුරු විලියම් ගොපල්ලව මහතා අතින් රන්වන් පදක්කමක් ද පිරිනැමිණ.

මෛත්‍රී කවියෙකු ලෙස පුවත්පත් ලෝකය හඳුනාගත්තේ ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර හදාරණ අවධියේ දීය. ඔහු ලියූ සඳැස් මෙන්ම නිසඳැස් කවි ද නිතර සිළුමිණ පත්‍රයේ පළවූ සැටි මට තවම මතක ය.

**සුදුවැලි** ගී සංයුක්ත තැටියේ මෛත්‍රී විසින් රචනාකරන ලද මනබඳින ගීත **19** ක් වෙයි.

නීලා වික්‍රමසිංහ, නිරංජලා සරෝජිණී, අබේවර්ධන බාලසූරිය, ටී. එම්. ජයරත්න, අමරා රණතුංග එච්. ආර්. ජෝතිපාල ආදී ප්‍රවීන ගායන ශිල්පීන්ගේ ගායනා අතරට තවම ප්‍රසිද්ධියට නොපත් එහෙත් ඉහළ ගායන දක්ෂතා ඇති නවක ශිල්පීන් කීප දෙනෙකුගේ ගීත ද අඩංගු ව ඇත. මෛත්‍රීගේ රචනා අතර ශ්‍රීලංකාවේ ශ්‍රාවකයින් ඉතා අගේ කරන පදමාලා රැසක් ද වෙයි.

නීලා වික්‍රමසිංහ ගයන- අන්න බලාපන් පුතුනේ, හෙට උපදින පුංචි පුතේ, ටී. එම්. ජයරත්න ගයන 'පාවී පාවී මේ එන්නේ ; එච්. ආර්. ජෝතිපාල ගයන-'මම යනවා මම යනවා' වැනි ගැයුම් දේශාභිමානය දනවනවා සේම ඕනෑම යුගයකට ගැලපෙන නොඅඩුව රසවිඳිය හැකි කාව්‍ය නිර්මාණයෝ වෙති.

ඉහතකී ගී සරණියට රසවත් මිහිරි තනු නිර්මාණයෙන් හා සංගීත සංයෝජනයෙන් දායක වූ සංගීත ශිල්පීන් පිරිස අතර ප්‍රවීන සංගීතඥයෝ සිව් දෙනෙක් වෙති. ඒ ආචාර්‍ය ප්‍රේමසිරි කේමදාස, ලයනල් අල්ගම, දයාරත්න රණතුංග හා සංගීත් වික්‍රමසිංහ යි. ඒ අයගෙන් අල්ගම සහ කේමදාස යන මාස්ටර්ලා දෙදෙන අද ජීවතුන් අතර නැතත් මේ නිර්මාණ ඇසීමේ දී ඔවුන් සිහිපත් වෙයි.

ගීතයක් ශ්‍රවනය කරන කල ශ්‍රාවකයාගේ උනන්දුව සහ මනස යොමුවන්නේ ඒ වචන ශබ්ද කරන ගායකයා හෝ ගායිකාව වෙතය. අද ජනප්‍රිය බොහෝ ගායන ශිල්පීන්ගේ ගැයුම් වලට අසන්නන් ඇද බැඳ ගන්නටද ඒ ගීත හිතට වදින්නටද මූලික හේතුව ඒ රචනාවෙහි පදවල ඇති අදහස හා වචන වල ඇති මට සිළිටි ලලිත බවයි. එහෙත් ගීතය නිසා ගායකයා හෝ ගායිකාව කැපී පෙනෙනවා මිස ඒ ගීය ලියූ කවියා ගැන කතාකරනවා අඩුය. එහි හැටි එහෙමය.

මෛත්‍රී පනාගොඩ කවියාගේ පැනෙන් **සුදුවැලි** තැටියේ වැනි ගී පබැඳුම් නිරන්තරයෙන් ලියැවේවායි! ප්‍රාර්ථනා කරමින් නවතිමි.

♦ ***දයා ආනන්ද***

## වර්ෂ පූර්ණ සිහිකිරීමයි !



**ප්‍රේමරත්න අබේසේකර මහතා**

අභාවප්‍රාප්තව මේ මසට පුරා වසරක් සම්පූර්ණ විය. ඒ වෙනුවෙන් ලන්ඩන් බෞද්ධ විහාරයේ සංඝගත දක්ෂිණාවක් පැවැත්විණ. ඒ සියළු පින් ඔබට ලැබේවා ! අපි සැමදා ඔබ ආදරයෙන් සමරමු.! ඔබ අප සිතින් කිසිදා ඈත් නොවේ.

*අදරැති දූ දරුවන්, පවුලේ නෑදෑ හිතවතුන් සහ දයාබර බිරිඳ පද්මිණී*
**Hounslow, London**

Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk